# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2038/34 - 2017 සැප්තැම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බණ්ඩාරවෙල-දියතලාව ජලසම්පාදන ක්‍රමයේ මාරබැද්ද ප්‍රධාන ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 25 වැනි දින,<br>
අංක 35, ලක්දිය මැදුර,<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය.

5/2/1/1293


1A - G 0 26322 - 18 (2017/09)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*උපලේඛනය*

බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 67 N අයිස්ලැබ් වත්ත, ග්‍රාම නිලධාරි වසමේ අයිස්ලැබ් වත්ත, කේෂන් කොටස ගමේ පිහිටි අයිස්ලැබ් වත්ත කේෂන් කොටස නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 02ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටසඃ

*උතුරට* : තේ වත්තේ සිට ප්‍රධාන මාර්ගය දක්වා වූ පාර ;

*නැගෙනහිරට* : තේ වත්ත - කේෂන් කොටස ;

*දකුණට* : තේ වත්තේ සිට ප්‍රධාන මාර්ගය දක්වා පාර ;

*බටහිර* : එම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයඃ* ප්‍රධාන විධායක නිලධාරි
සී/ස. මල්වත්ත වැව්ලි සමාගම,
අයිස්ලැබ් වත්ත,
බණ්ඩාරවෙල.

10 - 365

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.